# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2292/02 - 2022 අගෝස්තු මස 08 වැනි සඳුදා - 2022.08.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* 4/1/ඉ/අත්පත්/91.
*ඉ. අ. අංකය:* 4-3/7/2016/එච්ඩබ්ලිව්/476.

මහජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 718 කෝවාන ග්‍රාම නිලධාරි වසමේ, කෝවාන ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල්ගේ කැඩැස්තර සිතියම් අංක 420207, කලාප අංක 02 හා 2020.06.25 දිනැති පත්‍ර අංක 10 හි කැබලි අංක 256 (කැබලි 01 ක්) වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0106 පමණ වූ පහත විස්තර සඳහන් ඉඩම් කැබලි :

01. **කැබලි අංකය 256**

ඉඩමේ නම: කෝන්ගොල්ලවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතේ 38 (අ) අතුරු විධානය යටතේ පවරා ගන්නා ලදී. ජයකොඩි ආරච්චිලාගේ අප්පුහාමිලාගේ චින්තා ප්‍රියංගනී; අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා; ප්‍රමාණය: හෙක්. 0.0106.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 සැප්තැම්බර් මස 28 වැනි දින පෙ. ව. 10.00 ට මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල්යේ දී, මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022 සැප්තැම්බර් මස 14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එන්.ජී.එස්. ප්‍රියංකර,
ප්‍රාදේශීය ලේකම්,
මල්ලවපිටිය.

2022 ජුනි මස 17 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මල්ලවපිටිය.

EOG 08-0033